22/05/2011 - ඉරිදා ලංකාදීප

**සම්බුද්ධත්ව ජයන්තිය සමග මතුකර ගත යුතු වසර 2600 ක් ඉපැරණි - ගිරිහඬු මහ සෑය - මිලින්ද මොරගොඩ**

ශ්‍රී සම්බුද්ධත්වයෙන් 2600 වැනි සංවත්සරය සමරන්නට ශ්‍රී ලාංකික සැදැහැවත් මහත් උනන්දුවක් දැ දැක්වූහ. සම්බුද්ධත්ව ජයන්ති රාජ්‍ය උත්සවය අනුරාධපුර පූජාභූමියේ දී සියලු නිකායන්හි මහා සංඝරත්නයේ සහභාගීත්වයෙන් පසුගියදා සංවිධානය කෙරිණ. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එහිදී සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයක් ප්‍රකාශයට පත් කළේය. එමගින් ඉදිරි වසර තුළ බුද්ධ දර්ශනය හා එයින් සමාජය පුබුදුවන්නට ගත හැකි පිළිවෙත් සම්බන්ධයෙන් මහත් උනන්දුවක් ඇතිවන බව නිසැකය.

බුද්ධාලම්බන ප්‍රීතිය සමාජයෙන් පිළිබිඹු විය. ජනතාව විශාල වශයෙන් සීල සමාදන් වූහ. දූ දරුවන් සමග දස සිල් හි පිහිටුවන ලද පවුල් ගණන විශාල බව විවිධ ප්‍රදේශ වලින් ලැබුණ වාර්තා පෙන්නුම් කළේය. සම්බුද්ධත්ව ජයන්තිය සමරන තේමාව ''පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන පාඨයයි. සියලුම ජනමාධ්‍ය සම්බුද්ධත්ව ජයන්ති පණිවුඩය ලෝකය පුරා පතුරවන්නට විශාල මෙහෙවරක් කළහ. එය පිටුපස යම් යම් ව්‍යාපාරික පෙළඹවීම් තිබුණ බව නිරීක්ෂණය කළ හැකි නමුත් පවතින සංකීර්ණ සමාජය තුළ තරඟකාරීත්වය හා මූල්‍ය වටිනාකමට ඇති අවස්ථා සම්පූර්ණයෙන්ම පාලනය කිරීම පහසු නැත. ජන සමාජය විශාල පරිවර්තනයකට යොමු කිරීම උදෙසා බුදු දහම මගින් කළ හැකි බලපෑම පුලුල්ය. වර්තමානයේ දී බුද්ධ දර්ශනයට ජගත් ප්‍රජාවගේ වැඩි අවධානයක් හිමි ව ඇත. බුද්ධ ධර්මය කාලීන ප්‍රායෝගික දර්ශනයක් ලෙස තහවුරු වී තිබේ. යථාවබෝධය ළඟා කර ගැනීම ට අනුගමනය කළ යුතු මග බුද්ධ දේශනාවේ සඳහන්ය. එහි ඇත්තේ සදාකාලික දර්ශනයකි. එය කෙරෙහි අනුගත වන්නට අප සූදානම් විය යුතුය.

ත්‍රස්තවාදය අවසන් කිරීම සමග ශ්‍රී ලාංකේය සමාජය හමුවේ ඇත්තේ අලුත් යුගයකි. දැන් රටට අවශ්‍ය නව දර්ශනයකි. නව මගක් ගොඩනගා ගැනීම ඉදිරියේ සම්බුද්ධත්ව ජයන්තිය වැදගත් සංකේතයක් බව පැහැදිළිය. 2600 සම්බුද්ධත්ව ජයන්තිය සංකේතයක් සේ සලකා බුදු දහමේ හරය අනුව යමින් නිසි පිළිවෙත් මගින් රට නිසි මගට ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිතය. සමාජය ගමන් මග සමග ශාසනයේ ව්‍යාප්තිය එහි අවැත දකින අතරතුර අප විසින් අමතක කර ඇති ශාසනික වැදගත් සංඩිස්ථාන සිහිපත් කළ යුතුය.

ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ, බුද්ධත්වයට පත්වීමට පිටදුන් ජය ශ්‍රී මහා බෝධිය සහ බුදු සිරිපතුල බොදුනු ජනතාව මහත් ගෞරවයෙන් සළකන ප්‍රධාන පූජණීය වස්තූන්ය. ඒවා මෙරට ඇති විශේෂිත බෞද්ධ සංකේතයන්ය. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ගිරිහඬු සෑය ද මෙවැනි වැදගත්කමකින් යුතු පුද බිමකි. පැවති ත්‍රස්තවාදී ගැටුම් හෙයින් ජන අවධානයෙන් ගිළිහී ඇති මෙම පින් බිම අද යළිත් බොදුනුවන්ගේ අවධානයට ලක්විය යුතුය. ත්‍රස්තවාදය තුරන් වී ඇති සහ සම්බුද්ධත්ව ජයන්තියෙන් දෙදහස් හයසිය වැන්න සමරන විට ගිරිහඬු සෑය ඉතාමත් වැදගත්ය.

ගිරිහඬු සෑය බොදුනුවන්ට වැදගත්වන්නේ ඇයි? එය බුදුරජානන් වහන්සේ ජීවමාන අවස්ථාවේ දීම හිමිකර ගත් කේෂ ධාතූන් තැන්පත් කර තැනූ මෙරට ප්‍රථම ස්ථූපය සේ වාර්තාගතවෙයි. එසේම එය වටා ඇති නටඹුන්, මගින් මෙරට පළමු වටදාගෙය වශයෙන් ද සැලකිය හැකිය.

වෙසක් පුන් පොහෝ දින ශ්‍රී සම්බුද්ධත්වයට පත් බුදුරජානන් වහන්සේ තමන්ට බුදු වීමට උපකාර කළ බෝධිය ට උපහාර කළ බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙයි. සත් සතියක් පුරා කළ ප්‍රතිඋපහාර අවසානයේ එළැඹි පනස්වන දිනයේ දී වනයට අධිපතිදේවතාවියකගේ ඉල්ලීම පරිදි පැමිණි තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් බුදුරජානන් වහන්සේට විළඳ හා මීපැණි ප්‍රථම දානය ලෙස පිළිගන්වන ලද බව පූජාවලියේ සඳහන්ය. දානය පිළිගැන්වීමෙන් චිත්ත ප්‍රබෝධයට පත් මෙම වෙළඳ දෙබෑයෝ වැඳුම් පිඳුම් සඳහා පූජා භාණ්ඩ ඉල්ලා සිටි අවස්ථාවේ බුදු රජානන් වහන්සේ හිස පිරිමැද කේශධාතූන් වහන්සේලා ලබා දුන් බව ද පූජාවලියේ වැඩිදුරටත් සඳහන්ය.

පුද සත්කාර ලබන්නට එකතු කරගත් කේෂ ධාතූන් වහන්සේ ද රැගෙන වෙළඳ දෙබෑයන් දඹදිව උත්තලා නගරයේ සිට සිට ලංකාවට පැමිණ ඇත. ඔවුහු ගොඩ බැස ඇත්තේ ත්‍රිකුණාමලය ප්‍රදේශයටය. කුච්චවේලිය, කට්ටුකුලම් ප්‍රදේශයේ ගල්වරායෙන් ගොඩබිම සමීපයට පැමිණ යාංඔය ඔස්සේ ගිරිකණ්ඩ පර්වතයට මෙම වෙළඳ දෙබෑයෝ ළඟාවී තිබේ. එහි පිහිටි සුරක්ෂිත තැනෙක බුදුරජානන් වහන්සේ ජීවමාන අවස්ථාවේ දීම ලැබුණ කේෂධාතූන් සහිත මංජුසාව තැන්පත් කර සිය ආහාර ගෙන ඇති අතර ආහාර ගෙන අවසන්ව පිටත්ව යන්නට සූදානම්වන අවස්ථාවේ දී මෙම කේෂ ධාතූන් එතැනින් ඉවත් කර ගත නොහැකි වූ බව ත්, එහිම එය නිධන් කොට ගිරිහඬු සෑය ඉදි කළ බවත් ඉතිහාසය ගැන දක්වන මහාචාර්ය එච්. ටී. බස්නායක මහතා ලියන ලද ''ගිරිහඬු මහ වෙහෙර පින් බිම තිරියාය'' කෘතියෙහි සඳහන් වෙයි. මෙරට ඉදිවූ පළමු බෞද්ධ සංකේතය ගිරිහඬු මහ වෙහෙර බව  සැළකිය හැකි සාධක හමුවී ඇත. එපමණක් නොවේ. මෙම ස්ථානය ලෝකයේ පළමු බෞද්ධ සිද්ධස්ථානය  වන්නට ද බැරි නැත.

ඓතිහාසික කරුණු හා එකී කරුණු ගැඹුරෙන් විමසා බලා අවධානය යොමු කරන විට තපස්සු භල්ලුක දෙබෑයන් මෙරටට පැමිණියේ බුදුරජානන් වහන්සේ ජීවමාන සමයේ දී ම විය හැකිය. එවැනි ඉතිහාසයක් අන් තැනෙක කියැවෙන්නේ නැත. ජීවමාන අවස්ථාවේ දීම වැඳුම් පිදුම් වෙනුවෙන් ලැබුණ පළමු පූජනීය වස්තුව තැන්පත්ව ඇත්තේ ගිරිහඬු මහ වෙහෙර ගර්භයේය. බුද්ධත්වයට පත්ව වසර දෙහස් හයසියය සමරන ශ්‍රී ලාංකික බොදුන්වන්ට මෙයට වඩා අන් සංකේතයක් කුමටද?

එයින් පසු කළෙක දේවානම් පියතිස්ස රජ සමයේ දී මෙරටට බුදුදහම දායාදයක් ලෙස ලැබිණ. දන්ත ධාතූන් වහන්සේ වැඩමවා ඇත්තේ බුදු රජාණන් වහන්සේ ගේ අභාවයෙන් සෑහෙන කාලයකට පසුවය. බුදු සිරි පතුළ සිරිපා බිමෙහි පිහුටුවන්නට ඇත්තේ ද කේෂධාතූන් ගිරිහඬු සෑ බිමෙහි තැන්පත් කිරීමෙන් පසුවය. බුදු රජානණන් වහන්සේ බුද්ධත්වයට පිට දුන් බෝධි ශාඛාවක් වැඩම වූයේ මෙරට බුද්ධ හාසනය පිහිටුවීමෙන් පසුවය. මෙම කරුණු ගවේශනය කළ යුතුය. පසු කාලයක ගිරිහඬු සෑය පිහිටි මෙම ශෛලමය පර්වතයේ කටාරම් කොටා බ්‍රාහ්මී ලිපි පිහිටුවා මහ සඟරුවනට පුද කිරීමෙන් මෙම පුද බිමේ දෙවන අදියර ඇරඹී ඇති බවත්, අටවන සියවස වන විට වටදගෙය ඉදිකර ඇති බවත් පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමිපාණෝ සිය කෘතිවල සඳහන් කරති. ගිරිහඬු සෑය වෙනුවෙන් එම විහාරස්ථානාධිපති ගන්දර ධර්මකීර්තී ශ්‍රී ආනන්ද නායක හිමිපාණන් රචිත කෘතියක ද මෙම සිද්ධස්ථානය සම්බන්ධව තොරතුරු දීර්ඝ වශයෙන් අනාවරණය කර තිබේ. මහනුවර යුගයේ දී රචිත නම් පොත නමැති විහාරස්ථාන නාමාවලිය මෙකී පුද බිම නිතුපත්පාන යනුවෙන් හඳුන්වා ඇත. නිති පතා දැල්වුණ පහනක් තිබෙන ස්ථානය පසුව නිතුපත්පාන යනුවෙන් බිඳී ව්‍යවහාරයට ආ බව සැලකෙයි.

කාලාන්තරයක් මහා වනාන්තරයෙන් වැසී තිබුණ ඓතිහාසික වැදගත් කමකින් යුතු  ගිරිහඬු සෑය පුද බිම 1929 වසරේ දී හමුවූ ලියැවිල්ලක් අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේශනයට ලක් කර ඇත. එය තහවුරු වීමෙන් පසු කේෂධාතූන් නිධන් කොට ඉදිකළ ගිරිහඬු සෑය මෙය බව රජයේ ගැසට් නිවේදනයකින් ස්ථිරව ප්‍රකාශයට පත්කර තිබේ. 1951 වසරේදී මෙම තොරතුරු දැනගැනීමෙන් අනතුරුව එවකට අග්‍රාමාත්‍ය ධුරය හෙබවූ ඩී. එස්. සේනානායක මැතිතුමා පුරාවිද්‍යා අධිකාරී සෙනරත් පරණවිතාන ශූරීන් ලවා තිරියායේ පුරා විද්‍යා කඳවුරක් ඇති කර බොදුනුවන්ගේ අවධානයට ලක් විය යුතු මෙම වැදගත් සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කර ඇත. පසුව වටදා ගෙය ද හෙළි පෙහෙළි කර මතු කරගෙන තිබේ.

ගිරිහඬු සෑය පිහිටා ඇත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යාංඔය මුහුදට ගලා බසින ස්ථානය සමීපයේය. මෙම පුදබිම 1985 දී ත්‍රස්තවාදී ගැටුම් නිසා විනාශ වී ජනශූන්‍ය විය. ගිරිහඬු සෑය ඇතුලු වටිනා ඓතිහාසික වස්තූන් ආරක්ෂා කළේ කුච්චවේලි පොලිසියයි. 1985 වසරේ දී පොලිසියට ප්‍රහාරයක් එල්ල විය. එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් මෙම විහාරස්ථානයට දකුණෙන් පැවති සම්බන්ධතා විනාශ කළේය. විහාරස්ථානයේ වැඩ විසූ නායක හිමිපාණන් ඇතුලු පහලොස් නමක් දිවි ගලවාගෙන බලවත් වාසනාවකින්ය. බණ මඩුව, විහාර ගෙය ඇතුල් ගොඩනැගිලි කඩා බිඳ දමා ඇත.  2005 වසරින් පසු ගැටුම් තවත් උත්සන්න වූ හෙයින් ගිරිහඬු සෑය මහා විහාරස්ථානය හුදෙකලා විය. බොදු බැතිමතුන්ට එහි ළඟාවිය නොහැකි වී ඇත. පසුව නාවික හමුදාව විසින් මෙම භූමිය අත්පත් කරගෙන

තිබේ. හිටපු නාවික සමුද්‍රපති අද්මිරාල් දයා සඳගිරි මහතාගේ මැදිහත්වීමෙන් නැවත ආගමික වතාවත් ආරම්භ කර ඇත. ත්‍රිවිධ හමුදාව මෙවැනි සිද්ධස්ථාන ආරක්ෂා කර එහි අතීත වැදගත්කම නැවත මහජනතාවට දැක බලා ගන්නට සැලැස්වීම වැදගත් කාර්යයකි.

වසර තිහක් පැවති යුද්ධය නිසා අන්ධකාරයෙන් වැසී තිබුණ ගිරිගඬු සෑ පුදබිම යළි බොදු දනන්නට විවෘතය. ගැටුම් අවසන් වීමත් සමග ග්‍රින නැවතත් තිරියායට වන්දනාවේ යන බොදුනු දනන්ගේ බැති බර වන්දනාවට ගිරිහඬු සෑය එකතුවී තිබේ. විවිධ යුග වලදී බෞද්ධාගමේ පැවැත්මට ඇති වූ තර්ජන හා නොසලකා හැරීම් නිසා වටිනාකම්ක් සහිත ස්ථාන අනවධානයට ලක්ව තිබීම කණගාටුවට කරුණකි. රට පුරා එවැනි වැදගත් සංකේත හඳුනාගෙන ඒවා මතු පරපුර වෙනුවෙන් විශේෂ සංරක්ෂිත වැඩ පිලිවෙලක් ඇරඹීම අපගේ යුතුකමෙකි. ගිරිහඬු සෑය සම්බන්ධයෙන් නොයෙකුත් පුරා විද්‍යා පර්යේෂණ පවත්වා ඇති අතර ඒ අවටින් හමුවූ ශිලා ලේඛන කියැවීමෙන් මෙරට ඉතිහාසය හා බැඳුණු විශිෂ්ඨ අනන්‍යතා හඳුනා ගන්නට විද්වතුන් සමත්ව ඇත. අභාග්‍යය වී ඇත්තේ බුදු රජාණන් වහන්සේ ගේ කේෂ ධාතූන් නිධන් වූ බවට සැලකෙන මෙම බොදු බිම නිසි වැදගත් බුහුමනට ලක් නොවීමයි. වසර දෙදහසු පන්සියයක් දපිරෙන මෙම අවස්ථාවේ දී මෙම වැදගත් සිද්ධස්ථානය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

මෙම පුදබිම යළි බොදු බැතිමතුන්ට පහසුකම් සහිත ස්ථානයක් කරන්නට අවශ්‍යය. වරක් ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ සභාපති අග්ගමහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස හිමිපාණන් ප්‍රමුඛ ගිහි පැවිදි නියෝජිත පිරිසක් සමග මෙම භාග්‍යවත් භූමි භාගය නිරීක්ෂණය කරන්නට අවස්ථාව හිමිවිය. එහි ඇති වටිනාකම එහි යන ඕනෑම අයෙකුට අවබෝධ වනු නිසැකය. ස්ථූපය, ඒ අවට ඇති ගල්කණු වල නටඹුන් අනාවරණය කරන කරුණු විස්මිතය. ස්ථූපය කරා ළඟා වන්නට ගල් පඩි තුන්සියයකට වැඩි තැනින් තැන නතර වී විඩා නිවාගත හැකි මාවතකි. ගිරිහඬු සෑය පින් බිම අවට ඇති ගල් පාලම්, පඩි පෙළ හා ගල් පර්වතයට නැගෙන මාවත ශක්ති සම්පන්නව නිමවා ඇත. එහි ඇති ගල් තලාවේ ලියැවී නාගර අක්ෂර සෙල්ලිපිය මෙහි ඇති ඓතිහාසික වැදගත්කම තහවුරු කරයි. තවමත් එහි සාමාන්‍ය ජනතාව පදිංචි වී නැත. ඉඩ කඩම් වල අයිතිය නිරාකරනය වී නැත. ප්‍රවාහන පහසුකම් දුෂ්කරය. වන්දනාවේ යන බැතිමතෙකුට නවාතැන් පහසුකම් නැත. පිටතින් ආහාර පාන සපයා ගැනීම අපහසුය. එකී මූලික අවශ්‍යතා සපුරාලන්නට මගක් ඇත්නම් ගිරිහඬුසෑය බොදු ජනතාවගේ වන්දනාවට පාත්‍රවනු නිසැකය.

සාමාන්‍යයෙන් මෙවැනි තැන් රැක බලා ගැනීම පැවරෙන්නේ රජයටය. රජයට පමණක් එය කළ නොහැකි බව පිළිගත යුතුය. රජයේ නඩත්තුවෙන් තොරව සාර්ථක අන්දමට සිද්ධස්ථාන පවත්වාගෙන යන බව අපට පෙනෙන කාරණයකි. විශේෂ භාරකාරයක් මගින් වැඩි අවධානයකින් හා නිසි සැලැස්මකින් යුතුව වසර 2600 ක් පැරණි ගිරිහඬු සෑය පුණ්‍ය භූමිය යළි පුනර්ජීවනයකට ලක් කරන්නට ඇති අවස්ථාව අපට පෙනේ. ගිරිහඬු සෑය නගා සිටුවීම වෙනුවෙන් විශේෂිත වැඩ සටහනක් සකස් කළ හැකිය. සම්බුද්ධත්ව ජයන්තිය සමරන අවස්ථාවේ ගිරිහඬු සෑය වැනි දීර්ඝ ඉතිහාසයක් ඇති, මෙරට රටට වැදගත් බෞද්ධාගමික සිද්ධස්ථානයක් නගා සිටුවීමට සියලු දෙනා එකතුවීම අවශ්‍යය.